# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,351 - 2023 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.09.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1056 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1058 |


*සැ. යු.-* (i) සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2023 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1055 - B 82498— 5,403 (2023/09)

# පළාත් පාලන නිවේදන

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10 (2) ප්‍රකාර ව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය **2023.09.25 දින** සිට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී, කාර්යාලීය වේලාව තුළ මහජනතාව වෙත පරීක්ෂා කර බැලීමට ඉඩකඩ සලසා ඇති බව මෙමගින් දැනුම් දෙමි.

කේ. පී. චන්දන කුමාර,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.
ප්‍රාදේශීය සභාව,
නාත්තන්ඩිය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-303

---

## හෝමාගම ප්‍රාදේශීය සභාව

ත්‍රීරෝද රථ ගාල් පිහිටුවීම

1997 අංක 06 හා 2015 දෙසැම්බර් 28 දින *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 2016.09.23 වැනි දින අංක 1986 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව පහත සඳහන් තීරණය ගෙන ඇති බව නිවේදනය කරමි.

කේ. බී. ටී. කුමුදුනී ගුණතිලක,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
හෝමාගම.

2023 ජූලි මස 24 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

රථගාල් අංක : හෝ/ප්‍රා. ස./රථගාල/24

සමගි ඒකාබද්ධ ත්‍රීරෝද රථ සංගමය විසින් ත්‍රීරෝද රථගාලක් ඇති කිරීම සඳහා කර ඇති ඉල්ලීම හා හෝමාගම ප්‍රාදේශීය සභා රථ වාහන කමිටුවේ නිර්දේශය පරිදි හෝමාගම ප්‍රධාන බස් නැවතුම්පොළ අසල එන්. එස්. බී. බැංකුව ඉදිරිපිට රථගාල පිහිටුවීමටත්, ඒ සඳහා ත්‍රීරෝද රථ 15 ක් එකවර නවතා තැබීමටත්, රථගාල සඳහා ත්‍රීරෝද රථ 65 ක් සඳහා අවසර ලබා දීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

09-304/1

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

ත්‍රීරෝද රථ ගාල් පිහිටුවීම

1997 අංක 06 හා 2015 දෙසැම්බර් 28 දින *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 2016.09.23 වැනි දින අංක 1986 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව පහත සඳහන් තීරණය ගෙන ඇති බව නිවේදනය කරමි.

කේ. බී. ටී. කුමුදුනී ගුණතිලක,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
හෝමාගම.

2023 ජූලි මස 24 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

රථගාල් අංක : හෝ/ප්‍රා. ස./රථගාල/25

රථගාල් අංක 04 යටතේ කලින් අනුමත කරන ලද මහින්ද රාජපක්ෂ විද්‍යාලය අසල ත්‍රීරෝද රථ සංගමයෙ හි ලියාපදිංචිය අහෝසි කර පිටිපන මාහේනවත්ත කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව ඉදිරිපිට ත්‍රීරෝද රථ සංගමය හා මහින්ද රාජපක්ෂ විද්‍යාලය අසල ත්‍රීරෝද රථ සංගමය ඒකාබද්ධව ත්‍රීරෝද රථ ගාලක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා හෝමාගම පොලිස් ස්ථානයේ අවසරය ලැබී ඇති නිසා මහින්ද රාජපක්ෂ විද්‍යාලය අසල දාම්පේ පාර ආරම්භක ස්ථානයේ වම්පස රථගාල පිහිටුවීමටත්, ඒ සඳහා ත්‍රීරෝද රථ 06 ක් එකවර නවතා තැබීමටත්, රථගාල සඳහා ත්‍රීරෝද රථ 50 ක් සඳහා අවසර ලබා දීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව තීරණය කරමි.

09-304/2

---

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

ත්‍රීරෝද රථ ගාල් පිහිටුවීම

1997 අංක 06 හා 2015 දෙසැම්බර් 28 දින *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 2016.09.23 වැනි දින අංක 1986 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව පහත සඳහන් තීරණය ගෙන ඇති බව නිවේදනය කරමි.

කේ. බී. ටී. කුමුදුනී ගුණතිලක,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
හෝමාගම.

2023 ජූලි මස 24 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

රථගාල් අංක : හෝ/ප්‍රා. ස./රථගාල/26

කහතුඩුව බුදු මැදුර අසල ත්‍රීරෝද රථ සංගමය විසින් ත්‍රීරෝද රථගාලක් ඇති කිරීම සඳහා කර ඇති ඉල්ලීම හා හෝමාගම ප්‍රාදේශීය සභා රථ වාහන කමිටුවේ නිර්දේශය පරිදි ජම්බුගස්මුල්ල කහතුඩුව මාර්ගයෙහි පොදු වෙළඳ සංකීර්ණය ඉදිරිපිට හොරණ කොළඹ ප්‍රධාන මාර්ගයේ සිට මාර්ගය පුළුල් කිරීමේ දී රථ ගාල ඉවත් කිරීමේ කොන්දේසියට යටත්ව රථගාල පිහිටුවීමටත්, ඒ සඳහා ත්‍රීරෝද රථ 15 ක් එකවර නවතා තැබීමටත්, රථගාල සඳහා ත්‍රීරෝද රථ 65 ක් සඳහා අවසර ලබා දීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

09-304/3

---

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

ත්‍රීරෝද රථ ගාල් පිහිටුවීම

1997 අංක 06 හා 2015 දෙසැම්බර් 28 දින *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 2016.09.23 වන දින අංක 1986 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් තීරණය ගෙන ඇති බව නිවේදනය කරමි.

කේ. බී. ටී. කුමුදුනී ගුණතිලක,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
හෝමාගම.

2023 ජූලි මස 24 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

රථගාල් අංක : හෝ/ප්‍රා. ස./රථගාල/27

පරණ පාර මීගොඩ එක්සත් ත්‍රීරෝද රථ සංගමය විසින් ත්‍රීරෝද රථ ගාලක් ඇති කිරීම සඳහා කර ඇති ඉල්ලීම හා හෝමාගම ප්‍රාදේශීය සභා රථ වාහන කමිටුවේ නිර්දේශය පරිදි පරණ පාර මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය අසල පිහිටුවීමටත්, ත්‍රීරෝද රථ සංගමයේ සභාපති එම්. පියල් දුෂ්‍යන්ත මහතාගේ එකඟතාවය පරිදි ත්‍රීරෝද රථ 10ක් එකවර නවතා තැබීමටත්, රථගාල සඳහා ත්‍රීරෝද රථ 100ක් සඳහා අවසර ලබා දීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

09-304/4

---

# විවිධ දැන්වීම්

**කුරුණෑගල මහා නගර සභාව**

කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාර සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2024 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 22 වැනි දින පවත්වන ලද මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණ කමිටුවේ දී නිර්දේශ අංක OFMC/04/2023/08/22/MA/R6 යටතේ පහත දක්වෙන යෝජනාව සිදු කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක් ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2024 වර්ෂය සඳහා ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නාගරික කොමසාරිස්වරයාගෙන් වලංගු

බලපත්‍රයක් ලබා ගත යුතු බවත් එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව යම්කිසි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් තවදුරටත් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රයක් සඳහාම 2024 වර්ෂය සඳහා පහත සඳහන් යෝජනාවේ ආකාරයට ගාස්තුවක් කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවද වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

" කුරුණෑගල මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/ 17 දරන 1989.01.20 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති මහ නගර සභා අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත 1 වැනි උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක් 2024 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගෙන් බලපත්‍රයක් ලබා ගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම එකී ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම II වන උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 අධිකාරය වන මහා නගර සභා ආඥපනතේ 247 (අ) වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් කුරුණෑගල මහා නගර සභාව යෝජනා කරන්නීය."

***I* වන උපලේඛනය**

| අනු. අංක | *I වැනි තීරුව* බලය දෙනු ලබන කාර්යය | *II වැනි තීරුව* පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 2,501 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| | *අන්තරාදයක ව්‍යාපාර :* | | | |
| 1. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 2. | පරණ ලෝහ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 3. | වාෂ්ප ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදගෙන දව ඉරීම. | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 4. | කොහු නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 5. | ගිනිපෙට්ටි නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 6. | පොල්තෙල් සිඳීම, ගබඩා කිරීම හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 7. | මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 8. | ඇසිටලීන නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 9. | සිගරට් නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 10. | රස කැවිලි නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 11. | ලී පෙට්ටි සෑදීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 12. | ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරනු ලබන්නාවූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 13. | මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නාවූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 14. | ඩිජිටල් හෝ අතින් හෝ පා පොලුවලින් හෝ යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 2,501 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 15. | පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 16. | ගෙන්දගම් සහ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 17. | තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 18. | 100 කට අධික ප්‍රමාණයක් පතරොම් ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 19. | අලුත් ටයර් ටියුබ් ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 20. | පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 21. | යාන්ත්‍රික ශීතකරණය හා වායුසමීකරණ අලුත්වැඩියාව සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 22. | ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 23. | ඉංග්‍රීසි බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 24. | ධාන්‍ය ගබඩා කිරීම හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 25. | කොප්පරා නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 26. | වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 27. | සියලුම මෝටර් වාහන ඇතුළු අනෙකුත් වාහන සේවා කිරීමේ (සර්විස්) ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 28. | ටින්කර් සහ පේන්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 29. | වළං නිෂ්පාදනය සහ ගබඩාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 30. | පොල්කටු අඟුරු නිෂ්පාදනය සහ ගබඩාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 31. | කොප්පරා සකස් කිරීම සහ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 32. | බීඩි නිෂ්පාදනය සහ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 33. | ස්වාභාවික මල් අලෙවි කිරීම සහ සැරසිලි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 34. | මිනී පෙට්ටි සෑදීම, ගබඩා කිරීම සහ සියලුම අවමංගල්‍ය සේවා කටයුතු කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 35. | වේවැල් හෝ පන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය හා ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 36. | සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 37. | ආයුර්වේද මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 38. | ඉන්ධන ගබඩාවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

අප්‍රසන්න ව්‍යාපාර :

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඌරු, ගව, එළු, කුකුළු, තාරා, කළුකුන් ආදී සත්ව ගොවිපලක් හෝ එවැනි සතුන් අලෙවි කිරීම හෝ එවැනි සතුන්ගේ මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 2. | කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 3. | සත්ත්ව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රරු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 2,501 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 4. | ශීතකළ හෝ නොකළ මස් සහ මාළු විකිණීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 5. | සත්ත්ව ආහාර නිෂ්පාදනය හෝ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 6. | හම් වර්ග ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 7. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 8. | සතුන්ගේ හම්, බෙටි, ඇට, කුඩු හෝ පොහොර හෝ විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 9. | එළවළු සහ පලතුරු ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 10. | මෘත දේහ එම්බාම් කිරීම ඇතුළු සියලුම මංගල අවමංගල සේවා කටයුතු කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 11. | බුලත්, පුවක්, හුණු, දුම්කොළ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 12. | ඉටිපන්දම් සෑදීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 13. | සුවඳ කූරු , කැට , කුඩු නිෂ්පාදනය කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 14. | හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 15. | රථ වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 16. | රථ වාහන පොලිෂ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 17. | කොණ්ඩා කැපීමේ සහ සැකසීමේ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 18. | රූපලාවන්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 19. | හෝටලයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 20. | නවාතැන් පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 21. | බත් කඩයක් හෝ ආපනශාලාවක් හෝ තේ කොපි කඩයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 22. | කිරි පට්ටි හා කිරි අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 23. | බේකරියක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 24. | සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 25. | සිසිල් බීම නිෂ්පාදනය සහ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 26. | අයිස් නිෂ්පාදනය සහ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 27. | මිනිරන් ගබඩා කිරීම,මිනිරන් සකස් කිරීම සහ වර්ග කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 28. | කාබනික සහ රසායනික පොහොර නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 29. | කලුගල් සහ කබොක් කැඩීම සහ විකිණීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 30. | බොරලු හෑරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 31. | පශු ගිලන්හලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 32. | පොහොර නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 33. | උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 34. | හුණු ගබඩා කොට තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 35. | නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය සිල්ලර සහ තොග අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 36. | බොම්බෙයි ළූණු සහ අර්තාපල් ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | I වැනි තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරුව<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 2,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 37. | කුරුඳු, කරදමුංගු හෝ කෙඳි ගෙන්දගම් දුම්ගසා සකස් කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 38. | සිමෙන්ති හොන්ඩර 25කට වැඩියෙන් ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 39. | ගම් වර්ග නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 40. | විෂබීජනාශක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලේවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 41. | රෙදි පවිත්‍ර කිරීමේ කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 42. | බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කර තබන්නා වූ ආයතනයක් පවත්ගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 43. | ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 44. | හිස් බෝතල් 100කට වැඩියෙන් ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 45. | කුරුඳු පොතු ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 46. | කොකෝවා ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 47. | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 48. | යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 49. | පිටි හෝ කුළු බඩු ඇඹරීම හෝ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 50. | පුන්නක්කු හෝ වෙනත් සත්ත්ව ආහාර ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 51. | රබර් භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 52. | මෝර වරල් සකස් කිරීම, අලෙවිය හා ගබඩාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 53. | පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 54. | කපුරු නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 55. | සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 56. | බතික් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 57. | සුරතල් මසුන් ඇති කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 58. | සිසිල් බීම අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 59. | සිංහල බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 60. | සෝයා අයිස් ක්‍රීම් හෝ වෙනත් අයිස් ක්‍රීම් වර්ග නිෂ්පාදනය කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 61. | යෝගට් හෝ කිරි ආශ්‍රිත වෙනත් ආහාර හෝ රස කැවිලි නිෂ්පාදනය කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 62. | එළවළු සහ පලතුරු ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 63. | සනීපාරක්ෂක භාණ්ඩ ගබඩාව සහ ආලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 64. | පානීය ජල බෝතල් ගබඩා කිරීම හා අළෙවි කිරීම. | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 65. | පෞද්ගලික රෝහලක් හෝ රෝගීන් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 66. | ඡායාරූප ශාලාවක්, ඡායාරූප මුද්‍රණ කටයුතු කරන රසායනාගාරයක් යන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | *I වැනි තීරුව* *බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 2,501 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 67. | පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම. | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 68. | පෞද්ගලික උපකාරක පංති හෝ වෙනත් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 69. | පුද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 70. | පුද්ගලික ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 71. | විශ්වවිද්‍යාල හා අනුබද්ධිත උපාධි, ඩිප්ලෝමා ආදිය පිරිනමන පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 72. | සංගීත, චිත්‍ර, නැටුම් සහ වෙනත් ලලිත කලා අධ්‍යාපන ආයතනයක් හෝ කලායතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 73. | පුද්ගලික හෙද අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 74. | පුද්ගලික දන්ත වෛද්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 75. | රෙදි පවිත්‍ර කාරක නිෂ්පාදන සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 76. | ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 77. | එළවළු / පලතුරු වගා කිරීමේ ගොවිපලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 78. | කුකුළු, කළුකුන්, තාරා සහ වෙනත් සතුන්ගේ බිත්තර අළෙවි කිරීම. | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 79. | පශු වෛද්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සත්ත්ව රෝග සඳහා වන බෙහෙත් ද්‍රව්‍ය අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 80. | ලුණු පැකට් කිරීම සහ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 81. | රටකජු, මුරුක්කු සහ වෙනත් බයිට් වර්ග නිෂ්පාදනය කිරීම හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 82. | වෛද්‍ය උපකරණ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 83. | බේකරි නිෂ්පාදන අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 84. | පේස්ට්‍රි අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 85. | පීසා නිෂ්පාදනය සහ අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 86. | තීන්ත වර්ග අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 87. | ලිහිසි තෙල් අළෙවි කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 88. | බිම් මල් වගා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 89. | යන්ත්‍ර අනුසාරයෙන් කළුගල් කැඩීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 90. | මුද්‍රණ යන්ත්‍රවල ටෝනර් අළුත්වැඩියාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 91. | සකස් කළ ආහාර කල්තබාගත හැකි ලෙස ඇසුරුම් කිරීම හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |

*අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඇසිඩ් ගැලුම් 05 කට වැඩියෙන් ගබඩාකර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 2. | ටයර් සහ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | *I වැනි තීරුව*<br>*බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව*<br>*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු.1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 2,501 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 3. | තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර 05 කට වැඩියෙන් ගබඩා කර තැබීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 4. | ඩ්‍රයි ක්ලීනින් කරන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 5. | යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් අලේප කිරීම, රිදී ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 6. | ගල් අඟුරු, ගෑස් නිෂ්පාදනය, ගබඩා කිරීම හා අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 7. | කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 8. | අශුද්ධ ලෝහ ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 9. | ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 10. | කිලෝ ග්‍රෑම් 02 කට වැඩි ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 11. | බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 12. | තාර පෙරීම සදහා ආයතනයක් පවත්වාගෙන යාම. | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 13. | ශීතකරණ අළුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම සහ පරීක්ෂා කිරීම සදහා ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 14. | මෝටර් කාර් එකලස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 15. | ස්කූටර් සහ මෝටර් සයිකල් එකලස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 16. | පුපුරන ද්‍රව්‍ය රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සදහා ආයතනයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 17. | වී, හාල්, කුළු බඩු ඇතුළු අනෙකුත් ධාන්‍ය වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 18. | මත්පැන්හලක් හෝ ස්කාගාරයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 19. | මෝටර් වාහන, යතුරුපැදි, පාපැදි, තණකොළ කපන යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 20. | දුම්කොළ ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 21. | වයින් ස්ප්‍රීතු  ගබඩාව සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 22. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 23. | ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 24. | වායුසමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 25. | ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

| අනු. අංක | I වැනි තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II වැනි තීරුව<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම<br>රු.1,500 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු. 1,501 ඉක්මවන එහෙත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු. 2,501 ඉක්මවන අවස්ථාවක<br>රු. ශත |
|---|---|---|---|---|
| 26. | ඇළුමිනියම් හෝ බෙලෙක් භාණ්ඩ නිෂ්පාදනය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 27. | මැණික් කැපීම හා ඔප දැමීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 28. | අශුද්ධ ලෝහ උණු කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 29. | පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 30. | බල මෙවලම් උපකරණ අළුත්වැඩියා කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 31. | වාහන වායුසමීකරණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 32. | ලෝහ භාණ්ඩ නිෂ්පාදනය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 33. | වාහන දුනු අළුත්වැඩියාව | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 34. | ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 35. | ඉවත දමන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 36. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 37. | යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන ලී මෝලක්, වඩු වැඩපලක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 38. | වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 39. | ගල් හා ලී කැටයම් කිරීම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 40. | දුරකතන සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |

### *II* වන උපලේඛනය

02 කොටස

| I වැනි තීරුව<br>වාර්ෂික වටිනාකම | II වැනි තීරුව<br>බලපත්‍ර ගාස්තුව<br>රු. ශත |
|---|---|
| 01. රු. 1500 නොයික්මවන අවස්ථාවක | 2,000 0 |
| 02. රු. 1501 ඉක්මවන නමුත් රු. 2500 නොයික්මවන අවස්ථාවක | 3,000 0 |
| 03. රු. 2501 ඉක්මවන විට | 5,000 0 |

"ඉහත 1 වැනි කොටසේ සඳහන් ව්‍යාපාර අතරින් අංක 19 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 21 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 20 යටතේ සඳහන් වන කිසියම් නවාතැන්පලක් හෝ ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පළ හෝ පවත්වාගෙන යනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලය හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළෙහි 2023 වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතුය. "

09-349/1

## කුරුණෑගල මහ නගර සභාව

2024 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 22 වැනි දින පවත්වන ලද මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණ කමිටුවේ දී නිර්දේශ අංක OFMC/04/2023/08/22/MA/R6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2024 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී

### යෝජනාව

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ආ වන වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2024 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු එකී කර්මාන්ත බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහා නගර සභාව යෝජනා කරන්නීය."

### *I වන උපලේඛනය*

| *අනු. අංකය* | *I වැනි තීරුව බලය දෙනු ලබන කාර්යය* | *II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු.1,500 0 නොයික්මවන අවස්ථාවක* | *රු. 1,501 0 ඉක්මවන එහෙත් රු. 2,500 0 නොයික්මවන අවස්ථාවක* | *රු. 2,501 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| | *අන්තරාදායක ව්‍යාපාර :* | | | |
| 1. | විසිතුරු භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 2. | සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 3. | සුවඳ පුයර නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 4. | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 5. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 6. | ලියුම් කවර සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 7. | අභ්‍යාස පොත් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 8. | විදුලි උපාංග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 9. | රූපවාහිනී ඇන්ටනා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 10. | විදුලි බල්බ නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 11. | පිරිසිදු පානීය ජලය නිෂ්පාදනය සහ අලෙවිය | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 12. | පොල්ලෙලි කැබලි (කටර්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 13. | සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 | 3,000 0 | 5,000 0 |
| 14. | බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන අනෙකුත් සියලුම කර්මාන්ත | 2,000 0 | 3,000 0 | 5,000 0 |

II වන උපලේඛනය

| *1 වැනි තීරුව වාර්ෂික වටිනාකම* | | *II වැනි තීරුව බලපත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1. | රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 2,000 0 |
| 2. | රු. 1,501 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක | 3,000 0 |
| 3. | රු. 2,501 ඉක්මවන විට | 5,000 0 |

09-349/2

---

**කුරුණෑගල මහා නගර සභාව**

2024 වර්ෂය සඳහා ව්‍යාපාර විෂය බද්ද පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 22 වැනි දින පවත්වන ලද මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණ කමිටුවේ දී නිර්දේශ අංක OFMC/04/2023/08/22/MA/R6 දරන අංක යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2024 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර විෂය බද්ද 2024 මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ඇ වන වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247 ආ වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද, කිසියම් ව්‍යාපාරයක් කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී කරගනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් ලෙස 2024 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහා නගර සභාව යෝජනා කරන්නීය."

*II වන උපලේඛනය*

| *I වැනි තීරුව බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | | *II වැනි තීරුව ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|---|
| 01. | රු. 6,000 නොයික්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| 02. | රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොයික්මවන අවස්ථාවක | 90.00 |
| 03. | රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොයික්මවන අවස්ථාවක | 180.00 |
| 04. | රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොයික්මවන අවස්ථාවක | 360.00 |
| 05. | රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොයික්මවන අවස්ථාවක | 1,200.00 |
| 06. | රු. 1,50,001 ඉක්මවන විට | 3,000.00 |

09-349/3

**කුරුණෑගල මහා නගර සභාව**

2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ අගෝස්තු මස 22 වැනි දින පවත්වන ලද මෙහෙයුම් හා මූල්‍ය කළමනාකරණ කමිටුවේ දී නිර්දේශ අංක OFMC/04/2023/08/22/MA/R යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන ලද බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2023 සැප්තැම්බර් මස 01 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී.

**යෝජනාව**

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ඇ වන වගන්තිය අනුව මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක (කුඹුරු ඉඩම් හැර) හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළහැකි විටක එවැනි යම් ඉඩමක,

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

*(ආ)* ඒ ඉඩම (කුඹුරු ඉඩම් හැර) විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1:2 (එකට දෙක) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2024 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 0.5% (සියයට දශම පහක) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2024 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහා නගර සභාව යෝජනා කරන්නීය".

09-349/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.